www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වරාය කම්කරු අරගලයට එරෙහි ශ්‍රී ලංකා ආන්ඩුවේ ප්‍රහාරයට විරුද්ධ වනු

## Oppose Sri Lankan government's attack on port workers struggle

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**

**2006 ජුලි 20**

වැටුප් ඉහල දමන ලෙස ඉල්ලා ගෙන යන සිය අරගලය දෙවන සතියට අවතීර්න වීමත් සමග ශ්‍රී ලංකාවේ කොලඹ වරාය කම්කරුවෝ තීරනාත්මක දේශපාලන ප්‍රශ්නවලට මුහුන දී සිටිති. අරගලයට සම්බන්ධිත වෘත්තීය සමිතිවලට එරෙහිව ආන්ඩුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (එස්එල්පීඒ) දිස්ත්‍රික් උසාවි නියෝගයක් ලබා ගෙන ඇති අතර, තමන් වර්ජක වෘත්තීය සමිති සමග සාකච්ඡා නොකරන බව වරාය ඇමති මංගල සමරවීර ප්‍රකාශ කොට ඇත.

ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව මහින්ද රාජපක්ෂගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව එල්ල කර ඇති මෙම ප්‍රහාරයට සෑම තැනකම වැඩ කරන ජනතාව විරුද්ධ විය යුතු අතර වරාය කම්කරුවන් හා ඔවුන්ගේ උද්ඝෝෂනය ආරක්ෂා කිරීමට රැලි විය යුතු ය.

කොලඹ වරායේ 14,000ක් පමන වන කම්කරුවෝ, සිය මූලික වැටුප රුපියල් 3000කින් ඉහල දැමීම, ජීවන වියදම් දර්ශකයේ එක ඒකකයකට රුපියල් 3.50ක වැඩි වීමක් සහ රුපියල් 200ක අවම වාර්ෂික වැටුප් වර්ධකයක් ඉල්ලමින් ජුලි 12 දා අකුරට වැඩ කිරීමේ (හෙමින් වැඩ කිරීමේ) ව්‍යායාමයක් දියත් කලහ. ඔවුන්ගේ ඉල්ලීම් අනුව කිසිසේත් ප්‍රමානවත් නොවන, ආන්ඩුව විසින් ඉදිරිපත් කරන ලද සොච්චම් වැටුප් වැඩිවීම, කම්කරුවෝ මුල පටන් ම ප්‍රතික්ෂේප කලහ. කම්කරුවෝ සිය ඉල්ලීම් බලගතුව මතු කරනු වස් ජුලි 17 දා දිවා ආහාර පැයේ දී කොලඹ පැවති දැවැන්ත විරෝධතා ව්‍යාපාරයකට එක් වූහ.

ඊයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී සමරවීර ප්‍රකාශ කලේ, තමන් වෘත්තීය සමිති සමග සාකච්ඡා කරන්නේ කම්කරුවන් ආපසු වැඩට පැමිනිය හොත් පමනක් බව යි. තර්ජනාත්මක භාෂාවෙන් ඔහු තව දුරටත් සඳහන් කලේ තමන් "ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩ කඩාකප්පල් කිරීමට අවශ්‍ය නැති සියලු සේවකයන්ට නැවත වැඩට පැමිනෙන ලෙස ආරාධනා කරන" බවයි. ඔවුන් "රටේ ඉහල ම වැටුප් ලබන්නන් අතර" සිටින බැවින් වරාය අධිකාරියේ කම්කරුවන්ට ඔවුන් ඉල්ලා ඇති වැටුප් වැඩි කිරීම් නොලැබෙනු ඇතැයි ඔහු අවධාරනය කලේ ය. "සමිති කිහිපයක් තමන්ගේ ම න්‍යාය පත්‍රයක් අනුව ක්‍රියා කරමින් අසාධාරන ඉල්ලීම්වලට යටත් වන ලෙස ආන්ඩුව බියගැන්වීමට උත්සාහ කරයි" යැයි ඔහු පැවසී ය.

වරාය අධිකාරියේ ඉල්ලීම උඩ, දිස්ත්‍රික් උසාවිය බදාදා වාරන නියෝගයක් නිකුත් කලේ, කම්කරුවන් කාර්මික ක්‍රියාවේ නිරතව සිටින්නේ වෘත්තීය සමිතිවල බලපෑම හා බිය ගැන්වීම නිසාම පමනක් ය යන ව්‍යාජ හේතුවක් මත ය. යථාර්ථය නම්, වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය කැඳවූයේ ජීවන තත්වයන් මත රාජපක්ෂ ආන්ඩුව එල්ල කරන ප්‍රහාරයන්ට එරෙහිව වරාය අධිකාරියේ කම්කරුවන් අතර පුලුල්ව පැතිර ඇති අසහනය තුනී කිරීමේ විධි ක්‍රමයක් ලෙස ය.

උද්ඝෝෂනයේ ආරම්භයේ පටන් ම, වෘත්තීය සමිති ක්‍රියා කොට ඇත්තේ, ජනාධිපති සමග සම්මුතියක් ඇති කර ගැනීමේ උත්සාහ දරමින්, උද්ඝෝෂනය අවසන් කිරීමේ ක්‍රමයක් සැලසුම් කිරීමේ අභිප්‍රායෙනි. උසාවි නියෝගයට ද ආන්ඩුව, මහ ව්‍යාපාරිකයන් හා මාධ්‍ය විසින් පසු ගිය සතිය මුලුල්ලේ මුදා හරින ලද වරාය කම්කරුවන්ට බැට දීමේ ව්‍යායාමයට ද ප්‍රතිචාර වසයෙන් ඔවුන් කර ඇත්තේ තමන්ට තවමත් එම නියෝගයේ පිටපතක් ලැබී නැතැයි ආඩපලි කීම පමනි. කම්කරුවන් හෙමින් වැඩ කිරීමේ ව්‍යාපාරය දිගටම ගෙන යද්දී, වෘත්තීය සමිති නායකයන් සිය ආස්ථානය කුමක් දැයි තම සාමාජිකයන්ට තවමත් දැනුම් දී නැත. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි මෙම ප්‍රහාරයට විරුද්ධව කම්කරු පන්තිය පුරා අරගලයක් ගෙන යනවා වෙනුවට, සමිති, අරගලයට වල කැපීමට සූදානම් වේ.

වැඩි වැටුප් සඳහා වූ ඉල්ලීම මාස ගනනාවක් තිස්සේ වරාය කම්කරුවන් අතර වැඩෙමින් පැවතුනි. නිල ජීවන වියදම් දර්ශකය මේ වසරේ ජනවාරියේ දී පැවති ඒකක 4,304 සිට ජූනි වන විට ඒකක 4,730 දක්වා, ඒකක

426කින් ඉහල නැග ඇත. සෑම අංශයක ම වැඩ කරන ජනතාව ජීවත් වීම වඩ වඩා අසීරු වන ආකාරය අත්විඳිති.

පසු ගිය මාර්තු හා අප්‍රේල් මාසවල වැඩි වැටුප් ඉල්ලා ලක්ෂ සංඛ්‍යාත ආන්ඩුවේ සේවකයන් සිදු කල වැඩ වර්ජන සමිති නිලධරයන් විසින් හිර කර දමන ලදි. වතු කම්කරුවන් ඇතුලු අඩුම වැටුප් ලබන පුද්ගලික අංශයේ කම්කරුවන් ද සටන් වැදීමට ඇති සිය සූදානම පෙන්නුම් කර ඇති නමුත් එලෙසම සමිති විසින් හිර කරනු ලැබ තිබේ.

මාස ගනනාවක් තිස්සේ වැනෙමින් සිටි වරාය වෘත්තිය සමිතිවලට සිය සාමාජිකයන්ගේ පීඩනය යටතේ හෙමින් වැඩ කිරීමේ සීමිත උද්ඝෝෂනයක් කැඳවීමට බල කෙරුනි. පාලක එජනිසයේ නායක පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) අනුබද්ධිත ප්‍රගතිශීලී නිදහස් සේවක සංගමය, විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂයට (එජාප) සම්බන්ධිත ජාතික සේවක සංගමය සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) විසින් මෙහෙයවනු ලබන සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමය, වෘත්තීය සමිති 17 පෙරමුනට ඇතුලත් ය.

ආන්ඩුව සමග සෘජු ගැටුමක් වලකා ගනු පිනිස, සමිති නායකයෝ සම්පූර්න වැඩ වර්ජනයක් කැඳවීම මග හැරියහ. සිය ක්‍රියාමාර්ගයට එක් වන ලෙස ත්‍රිකුනාමලය හා ගාල්ල වරාය කම්කරුවන්ගෙන් ඉල්ලා සිටීම ඔවුන් ප්‍රතික්ෂේප කර ඇත්තේ, එම කම්කරුවන්ගේ සංඛ්‍යාව ඉතා සුලු බව ප්‍රකාශ කරමිනි. කෙසේ වෙතත්, හෙමින් වැඩ කිරීමේ ව්‍යාපාරය පවා රාජපක්ෂ ආන්ඩුවේ දේශපාලන හා ආර්ථික අර්බුදය ගැඹුරු කර ඇති අතර ඒ හේතු කොට ගෙන කම්කරුවන් ආන්ඩුව සමග සෘජු ගැටුමකට තල්ලු කර තිබේ.

කාර්මික ක්‍රියාව හේතු කොට ගෙන වරාය දිනකට රුපියල් මිලියන 100කට වඩා පාඩු ලබන බවට වරාය අධිකාරියේ බලධාරිහු පැමිනිලි කරති. ඊට අමතරව, ජාත්‍යන්තර සමුද්‍ර නීති රීතිවලට අනුව, පමා වන එක පැයක් වෙනුවෙන් විවිධ නැව් සේවාවලට එ.ජ. ඩොලර් 500 ගනනේ ගෙවීමට ද ඔවුන්ට සිදුව ඇත. එක දොඹකරයකින් පැයක දී බාන හෝ පටවන බහලු සංඛ්‍යාව 20 සිට 3-5 දක්වා පහත වැටී ඇතැයි පවසමින් ශ්‍රී ලංකා නැව්කරුවන්ගේ මන්ඩලය නිවේදනයක් නිකුත් කර තිබේ.

මහ ව්‍යාපාරිකයන්, තමන්ට සිදුව ඇති පාඩු ගැන සඳහන් කරමින්, හෙමින් වැඩ කිරීමේ ව්‍යාපාරයට එරෙහිව ක්‍රියාත්මක වන ලෙස ආන්ඩුවට බල කරමින් සිටින අතරතුර, මාධ්‍ය, "විශාල පඩි" ලබන්නන් යැයි වරාය කම්කරුවන්ට චෝදනා කරමින්, එම කම්කරුවන් කෙරෙහි පවත්නා සිය පන්ති වෛරය එලිදරව් කර ඇත. මෙය තවත් පචයකි. සාමාන්‍යයෙන්, වරාය කම්කරුවකුට මසකට රුපියල් 25,000ක් පමන ගෙවනු ලබන අතර, සමහර කම්කරුවන්ට අති කාල වැනි දීමනා සහිතව රුපියල් 30,000ක තරම් ප්‍රමානයක් ද ලැබිය හැකි ය. ජීවන වියදම තියුනු ලෙස ඉහල නගින හා ආන්ඩුව නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවය කප්පාදු කරන කොන්දේසි යටතේ මෙය සොච්චම් ප්‍රමානයකි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ නියෝග අනුව ක්‍රියා කරන රාජපක්ෂ ආන්ඩුවේ අභිප්‍රාය වී ඇත්තේ, අයවැය හිඟය අඩු කරනු පිනිස, වැටුප් වැඩි වීම් නතර කොට ඉන්ධන සහනාධාරය වැනි සහනාධාර කප්පාදු කිරීම හා "වෙලඳ පොල බලවේග" මගින් මිල ගනන් නිර්නය වීමට ඉඩ හැරීම යි. ඒ නිසාම ආන්ඩුව අතිශයින් ම උත්සුක වී ඇත්තේ, වරාය කම්කරුවන්ගේ අරගලය, වැඩි වැටුප් ඉල්ලා කරන සටනට එක් වීමට රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශයේ ම කම්කරුවන් සඳහා උත්ප්‍රේරකයක් බවට පත් විය හැකි ය යන්න ගැන යි.

උද්ඝෝෂනයට වල කපනු සඳහා, රාජපක්ෂ ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු පිනිස ත්‍රි-පුද්ගල කමිටුවක් පත් කිරීම මගින් වෘත්තීය සමිති නායකයන් වෙත ආධාරක හස්තය දිගු කොට ඇත. කමිටුවට ඉහල රාජ්‍ය නිලධරයන් ඇතුලත් ය -- ඒ වරාය හා නාවුක අමාත්‍යාංශයේ ලේකම් තිලක් කොල්ලුරේ, කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මහින්ද මහිහහේවා සහ වරාය අධිකාරියේ සභාපති සාලිය වික්‍රමසූරිය යන අයයි.

අමාත්‍ය සමරවීරගේ ප්‍රකාශ මගින් තහවුරු කෙරී ඇති පරිදි, කමිටුව කම්කරුවන්ගේ ඉල්ලීම් ලබා දෙන්නේ නැත. ආන්ඩුව රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ වැටුප් උද්ඝෝෂනයට මුහුන දුන් කල, මේ වසර මුල දී රාජපක්ෂ මේ ආකාර උපාය මාර්ගයක් අනුගමනය කලේ ය. ගැටලුව විසඳීමේ නාමයෙන්, ඔහු කොමිසමක් පත් කල අතර, එය ඉන් පසුව ක්‍රියා කලේ, සමිතිවල සහයෝගය ද ඇතිව කම්කරුවන්ගේ අරගලය මැඩ තැබීමට ය.

## දුෂ්ට උද්ඝෝෂනයක්

මාධ්‍ය සමග එක්ව, ත්‍රස්තවාදයට උදව් කරන බවට වරාය කම්රුවන්ට චෝදනා කිරීමට පැන ගෙන ඇති විවිධ ස්වෝත්තමවාදී කන්ඩායම් ද වරාය කම්කරුවන්ට එරෙහිව පෙල ගැසුනු අය අතර සිටී.

"වරාය අඩපන කිරීමේ සැබෑ තර්ජනය මතුවන්නේ ත්‍රස්තවාදීන්ගෙන් හා ඔවුන්ගේ කිමිදුම්කරුවන්ගෙන් නොව වෘත්තීය සාංගමිකයන්ගේ වේෂයෙන් පෙනී සිටින කඩාකප්පල්කාරී කොටස්වලිනී" යැයි සිය සිංහල වර්ගවාදී ආස්ථානය සම්බන්ධයෙන් කුප්‍රකට දි අයිලන්ඩ් පත්‍රය මෑත කතුවැකියක ලියා ඇත.

ජවිපෙ නායකත්වය දෙන සිංහල ස්වෝත්තමවාදී පෙරමුනක් වන දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ නායකයකු වන ඇල්ලේ ගුනවංශ නම් බෞද්ධ භික්ෂුව, ජුලි 16 දා රාත්‍රියේ ආන්ඩුවේ අයිටීඑන් රූපවාහිනී නාලිකාවේ පෙනී සිට, "විජාතික බල්වේග" විසින් ගෙන යන "කඩාකප්පල්කාරී" ක්‍රියාවක් ලෙස වරාය කම්කරුවන්ගේ අරගලයට පහර ගැසූ අතර කම්කරුවන්ගේ ක්‍රියාමාර්ගය නතර කරන ලෙස ද ඉල්ලා සිටියේ ය.

"ත්‍රස්තවාදීන්ට ද සිදු වනවා දැකීමට අවශ්‍ය හරියට ම මෙය යි. ආර්ථිකය අඩපන කරනු පිනිස වරායට පහර දීමට ඔවුන් ද උත්සාහ දරා ඇත. දැන් අපේ ම අය එය කරමින් සිටී." යනුවෙන් පැවසූවේ යැයි ආන්ඩුවට අයත් ඩෙලි නිව්ස් පත්‍රය "ආනයනකරුවන්ගේ සංගමයක ප්‍රකාශකයකු" උපුටා දැක්වී ය.

මෙම ප්‍රකාශ අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු ය. ඒවා මගින් පෙන්නුම් කෙරෙන්නේ, ආන්ඩුව, සිය වර්ගොත්තමවාදී සගයන් හා මාධ්‍ය සමග සන්ධානගතව, වරාය කම්කරුවන්ට එරෙහිව පමනක් නොව, සමස්තයක් ලෙස කම්කරු පන්තියට ම එරෙහිව, රුදුරු ප්‍රහාරයක් සඳහා සූදානම් වන බවයි. එමගින් තව දුරටත් පෙන්නුම් කෙරෙන්නේ, මිලිටරිය සමග පෙල ගැසී ගෙන, මෙම බලවේග විසින් අවුලුවාලනු ලබන දෙමල විරෝධී වර්ගෝත්තමවාදයේ හා යලි අලුත් කෙරුනු යුද ප්‍රකෝපකරනයන්ගේ එල්ලය, දෙමල ජනතාවට එරෙහිව පමනක් නොව, ශ්‍රී ලංකාව පුරා සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ අයිතීන් හා කොන්දේසි විනාශ කිරීම බවයි.

සමාජවාදී සමානතා පක්ෂය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වරාය කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ, මෙම දුෂ්ට උද්සෝෂනයටත් පටු ශ්‍රේනිවාදී හා වාර්ගික රේඛා ඔස්සේ තමන් භේද කිරීමට වෘත්තීය සමිති දරන ප්‍රයත්නයන්ටත් පිලිතුරු දෙනු පිනිස, රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශයේ ම සෙසු කම්කරුවන් දෙසට හැරී, වැඩි වැටුප්, ජීවන කොන්දේසි හා සේවා කොන්දේසි ආරක්ෂා කර ගැනීම, ප්‍රජාතන්ත්‍ර අයිතීන්, ශිෂ්ඨ සම්පන්න සුබසාධන සේවා වෙනුවෙන් සහ රාජ්‍ය අංශයේ ව්‍යවසායන් පුද්ගලීකරනය කිරීමට එරෙහිව පොදු අරගලයක් වර්ධනය කරන ලෙස යි. මෙම අරගලය සංවිධානය කොට වර්ධනය කරනු පිනිස වර්ජන කමිටු ගොඩ නගන ලෙස අපි ඉල්ලා සිටිමු. වඩාත්ම වැදගත් කරුන ලෙස සියලු කම්කරුවන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, යලි අවුලුවනු ලබන සිවිල් යුද්ධයට විරුද්ධ වී, උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත් කරන ලෙස ඉල්ලා සිටින ලෙස යි, රාජපක්ෂ ආන්ඩුවේ හා පාලක ප්‍රභූවේ ප්‍රහාරයන්ට මුහුන දිය හැකි එකම ක්‍රමය වන ස්වාධීන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමේ අරගලය තුල සිංහල හා දෙමල කතා කරන කම්කරුවන්ගේ ඒකමුතුව සඳහා සටන් වදින ලෙස යි.

© www.wsws.org